# මිලේනියම් වාර්තාව හා පිංකම

මිලේනියම්සිටි සංකීර්ණයෙහි නිවාසයක පවත්වාගෙන යනු ලැබූ හමුදා බුද්ධි අංශයේ නිවසක් වැටලීම පිළිබඳව පත්කළ ජනාධිපති කොමිසම් වාර්තාව නිකුත්වී ඇත. ඒ වාර්තාව පිළිබඳව අපේ ගෞරවය කොමිසමට හිමිවිය යුතුය. ඉතා පැහැදිලිව හා නිර්භයව වාර්තාව ලියා ඇති අතර මෙරට අධිකරණයට තවමත් කොන්ද කෙලින් කර ගෙන පැවතිය හැකි බවට ඒ වාර්තාව කදිම නිදසුනකි. ජනාධිපති කොමිසමට ඒ හිමි විය යුතු ගෞරවය පුද කරන අතර මෙරට පොලිස් හා හමුදා සේවයේ ඇතැමුන් ගැන කීමට ඇත්තේ එයට හාත්පසින්ම විරුද්ධ දෙයකි. හමුදා හා පොලිස් සේවාවල ද තවමත් අවංක හා දක්ෂ නිලධාරීන් හා සෙබළුන් සේවයකරන බව සත්‍යයකි. එහෙත් අවාසනාවකට යම් පිරිසක් ගැන එසේ කීමට නොහැකිය.

ජනාධිපති කොමිසම් වාර්තාව අනුව පොලිස් නිලධාරී උඩුගම්පොල මහතා ඇතුළු පිරිසක් ක්‍රියා කර ඇත්තේ රටට ද්‍රෝහී වන ආකාරයකටය. මිලේනියම් සිටි බුද්ධි අංශය කොටින්ට විශාල තර්ජනයක් වී තිබිණි යැයි සිතිය හැකිය. බුද්ධි අංශය ක්‍රියාත්මක වූ කාලයේදී කොටි නායකයෝ කිහිප දෙනෙක්ම මරු වැළඳ ගත්හ. ප්‍රභාකරන්ට පවා හමුදා බුද්ධි ඒකකය ළංවෙමින් පැවතුණි. තව කාලයක් බුද්ධි අංශයට ක්‍රියාත්මක වීමට ලැබුණේ නම් කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමේ හැකියාව තිබුණි. කොටි ත්‍රස්තවාදී ව්‍යාපාරය යනු තුවක්කුව, විජාතික විදේශීය අනුග්‍රහය හා මිථ්‍යා ප්‍රචාර මත යැපෙන සංවිධානයකි. මේ එකක් හෝ නොමැතිව කොටි සංවිධානයට පැවැත්මක් නැත.

ප්‍රභාකරන් යනු මහා වීර පුද්ගලයෙක් නොවේ. ඔහු දක්ෂයෙක්වත් නොවේ. ඔහු නිවටයෙකි. නිවටයකු වූ ප්‍රභාකරන් අසරණ සිංහලයන් වෙසෙන ගම්මානවලට පැන එහි ජීවත්වන්නවුන් මරා දමයි. මෙය නිවටයකුට මිස වීරෝදාර නායකයකුට ඔබින කාර්යක් නොවෙයි. ඔහු දන්නා අනෙක් කාරණය නම් මිනිස් බෝම්බ පිපිරවීමය. එය ඔහුගේ නිර්මාණයක් ද නැත්නම් ඇමරිකානුවන්ගේ හා වෙනත් අයගේ නිර්මාණයක්ද යන්න පැහැදිළි නැත. කාගේ නිර්මාණයක් වුව ද ඇමරිකානුවන්ට ද අද ඉරාකයේ මිනිස් බෝම්බවලට මුහුණ දීමට සිදුවී ඇත. කෙසේ වෙතත් කොටි සංවිධානය එක් පුද්ගලයකු වටා ගොඩනගා ඇති එකක් වෙයි. මෙවැනි සංවිධානවලට දිගුකල් පැවැත්මක් නැත. කොටි සංවිධානය ගොඩනගා ඇත්තේ ප්‍රභාකරන් වටාය. එහිදී විජාතික බලවේග ක්‍රියාකර ඇති ආකාරය ඉතා පැහැදිළිය.

ප්‍රභාකරන් යනු විජාතික බලවේග විසින් පුම්බන ලද පුද්ගලයෙක් පමණකි. ඔහු දෙමළ හින්දු ජනතාව නියෝජනය නොකරයි. එහෙත් දෙමළ ජනයා බියවද්දා ඔවුන් කොටි සංවිධානයට එරෙහිවීම වළක්වාගෙන ඇත. දෙමළ හින්දු ජනයා විශේෂයෙන්ම එසේ බියවද්දනු ලැබූ ජනතාව වෙති. විදේශ විජාතික බලවේග නියෝජනය කරමින් සෝල්හයිම් වැනි බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදී පෙන්දන් මෙන්ම පැටන් වැනි අධිරාජ්‍යවාදීන් ද මෙරට යැම් ඊම් කිරීමේ එක් අරමුණක් නම් දෙමළ ජනයාට ප්‍රභාකරන් පිළිබඳ වැදගත්කමක් ද නිර්මාණය කිරීමය. දෙමළ හින්දු ජනයා ප්‍රභාකරන් පිටුපස ඇති බලවේග ගැන ක්‍රමයෙන් තේරුම් ගනිමින් සිටිති. අද දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ තුළ සිදුවන්නේ දෙමළ හින්දු හා දෙමළ ක්‍රිස්තියානි බලවේග අතර ගැටුමකි. ආනන්ද සංගරී දෙමළ හින්දු බලවේගවලට නායකත්වය සපයන අතර ජෝසෆ් පරරාජසේකරම් දෙමළ ක්‍රිස්තියානි බලවේගය මෙහෙයවයි. පරරාජසේකරම් යනු මඩකලපු දෙමළ නායකයකි. ත්‍රිකුණාමලයේ ආර්. සම්බන්ධන් අද පරරාජසිංහම්ට සහාය දෙන්නේ ඔහු (සම්බන්ධන්) ද බියවද්දා ඇති බැවිනි.

ආනන්ද සංගරී කොටි සංවිධානයේ නායකත්වයට බිය නැති බව පැහැදිළිය. ඔහු නොබියව කියා සිටින්නේ දෙමළ ජනයාගේ එකම නියෝජිතයා කොටි සංවිධානය නොවන බවය. අන්තිම සිංහලයාගේ හමෙන් සෙරෙප්පු සාදන බව කියූ අමිර්තලිංගම් මහත්මියට ද කොටි ගැන තේරුණේ ඇගේ සැමියා මරා දැමීමෙන් පසුවය. අද ඇය ද කොටි සංවිධානය තරයේ විවේචනය කරන්නේ කොටි එකල ආදරණීය කොල්ලන් වූ බව අමතක කරමිනි. මෙරට දෙමළ හින්දු ජනයාට ඉගෙනීමට ඇති කරුණු තව බොහෝ වෙයි. එහෙත් ප්‍රභාකරන්ගේ කාලය සීමිත වෙයි. ප්‍රභාකරන්ගේ කාලය කොපමණ වුවත් ඔහු මිය යන්නේ නම් හෝ ඔහු මරා දමන්නේ නම් හෝ කොටි සංවිධානයේ ශක්තිය නොබෝ

© Prof. Nalin De Silva

කලකින්ම දිය වී යනු ඇත. මිලේනියම් සිටි බුද්ධි අංශයේ මෙහෙයුම් මගින් ප්‍රභාකරන් මරා දැමීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් විය.

එහෙත් එය එසේ නොවන බවට කටයුතු කිරීමට විජාතික බලවේගවලට අවශ්‍ය විය. පසුගිය මැතිවරණයෙන් විජාතික බලවේගවල සෘජු නියෝජිතයා වූ එ. ජා. පක්ෂය ප්‍රමුඛ එ. ජා. පෙරමුණ බලයට පත්වීමෙන් පසුව ඔවුන්ට ඒ සඳහා අවස්ථාව ලැබිණි. එ.ජා.පෙරමුණේ ඇමැතිවරුන්ට බුද්ධි අංශය පිළිබඳ තොරතුරු දැනගැනීමට ලැබුණු බවට සැකයක් තිබිය නොහැකිය. දේශපාලන උසස්වීම් සඳහා ඕනෑම පාවාදීමක් කිරීමට සූදානම් පොලිස් හා හමුදා නිලධාරීන් කිහිප දෙනෙකු හෝ මෙරට සිටීම රටේම අභාග්‍යයකි. එ. ජා. පෙරමුණට විරද්ධව ආයුධ රැස්කරන තැනක් ලෙස හඳුන්වමින් මිලේනියම් සිටි සංකීර්ණයෙහි පවත්වා ගෙන ගිය බුද්ධි අංශයේ නිවස වටලා සියලු තොරතුරු සතුරා අතට පත්කිරීමට දේශද්‍රෝහී පිරිසක් ක්‍රියාකර ඇති බව පැහැදිළිය.

රාජ්‍ය රහස් අනාවරණය කිරීමෙන් පසුව බුද්ධි අංශයේ නිලධාරීන්ට සිදුවූයේ කුමක්ද යන්න කවුරුත් දනිති. කොටි ත්‍රස්තවාදීන් විසින් බුද්ධි අංශයේ විසිතුන් දෙනෙකු මරා දමනු ලැබ ඇතැයි කියැවෙයි. ඒ අතර ප්‍රභාකරන් විනාශ කිරීම සඳහා ගෙන තිබූ සියලු පියවර ගඟට ඉනි කැපීමක් විය. මේ රටට සැබෑ සාමයක් අත්කර දිය හැක්කේ ප්‍රභාකරන් විනාශ කිරීමෙන් පමණකි. ඔහු ජීවත්ව සිටිනතාක් අසරණ සිංහලයන්ගේ පමණක් නොව මුස්ලිමුන්ගේ ද ජීවිත අනතුරේය. මිනිස් බෝම්බ අද පිපිරෙන්නේ නැත්තේ ඇමරිකාවේ උපදෙස් මත ප්‍රභාකරන් ඊනියා සාමය හරහා උතුරු හා නැගෙනහිර පළාත් ශක්තියට සවිකර ගැනීමට කටයුතු කරන බැවිනි. එහෙත් ඒ අතර නැගෙනහිර පළාතෙන් සිංහලයන් හා මුස්ලිමුන් පළවා හැරීම ඔහු අත්හැර නැත. අද ඒ පළාතේ මුස්ලිම් ජනයා ඝාතනය කෙරෙන්නේ ඔවුන් ඒ ප්‍රදේශයෙන් පළවා හැරීම සඳහාය. මුස්ලිමුන් පන්නා දැමීමෙන් පසුව සිංහලයන් පන්නා දැමීමට කිසිම අපහසුවක් නැති බව ප්‍රභාකරන් දනියි.

මේ මුස්ලිම් ජනයා ඝාතනය කිරීම සම්බන්ධයෙන් මෙරට ක්‍රියාත්මක වන ඊනියා සාම සංවිධාන කිසිවක් නොකරයි. මේ ඊනියා සාම සංවිධාන ඉතා වැඩි ප්‍රමාණයක් ක්‍රිස්තියානි සංවිධාන වෙති. ඉතිරි ටික ද පවත්වාගෙන යනු ලබන්නේ බටහිර ක්‍රිස්තියානි රටවල් විසින් දෙනු ලබන මුදලින්ය. මේ සංවිධාන නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයාට එරෙහිව කරන කොටි ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳව නිහඬ ඔවුන් ඒ අනුමත කරන බැවින් විය යුතුය. ඒ ත්‍රස්තවාදී ක්‍රියා මේ ක්‍රිස්තියානි සංවිධාන කල්පනා කරන ආකාරයට සාමය සඳහා ගන්නා වූ පියවර විය හැකිය. එමෙන්ම මේ සංවිධාන මෙරට බෞද්ධයන්, හින්දූන්, මුස්ලිමුන් පමණක් නොව ඇතැම්විට කතෝලිකයන් පවා කතෝලික නොවන ක්‍රිස්තියානීන් මෙරට බෞද්ධයන්, බවට පත්කිරීමේ දැවැන්ත වැඩපිළිවෙළ හමුවේ නිහඬය. අද මෙරට සාමයට බාධා

කරන ප්‍රධානම සංවිධානය කොටි සංවිධානය වෙයි. දෙවනුව මෙරට සාමයට බාධා කරන ආයතන වන්නේ ක්‍රිස්තියානි නොවන්නන් ක්‍රිස්තියානි කරන සංවිධානය. මේ දෙගොල්ලෝම සාම විරෝධීහු වෙති. ඊනියා සාම සංවිධාන මේ දෙගොල්ලන්ට විරුද්ධව වචනයක් හෝ නොකියයි. එයට හේතුව ඒ තුන්ගොල්ලන්ම එකම තැනකින් මෙහෙයවනු ලැබීමය. කොටි සංවිධානය හා බෞද්ධයන් ආදීන් ක්‍රිස්තියානි කරන සියයකට වැඩි සංවිධාන මෙන්ම ඊනියා සාම සංවිධාන ද මෙහෙයවනු ලබන්නේ බටහිර ක්‍රිස්තියානි රටවල් මගිනි. ප්‍රභාකරන් වීරයක් කරන්නේ ද සිංහලයන්, දෙමළ ජනයාට විරුද්ධව අසාධාරණකම් කරන බවට බොරු ප්‍රචාරවල යෙදෙන්නේ ද බටහිර මාධ්‍ය අනුග්‍රහයෙනි. මෙරට සාමය තරම් ලොකු බොරුවක්, වංචාවක්, මගෝඩියක්, ව්‍යාපාරයක් හා යුද්ධයක් තවත් නැත.

සාමය නමින් කෙරීගෙන යන්නේ මෙරට ක්‍රිස්තියානි නොවන්නන්ට, විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ට එරෙහි වූ සීතල යුද්ධයකි. මෙරට සිටින තකතීරු මාක්ස්වාදීන්ගෙන් බොහෝ දෙනා ද, ජීවිතයේ කිසිම දිනක අලුත් සංකල්පයක්, ප්‍රවාදයක් ගොඩනගා නොමැති ඊනියා බුද්ධිමත්තු ද (විශේෂයෙන්ම සමාජ විද්‍යාඥයන් හා දේශපාලන විද්‍යාඥයන් යැයි කියාගන්නා අය - මොවුන් විද්‍යාඥයන් යැයි කියාගත්ත ද අටවැනි පන්තියෙන් පසුව හරිහමන් බටහිර විද්‍යාවක් ඉගෙන ගෙන නැත.) මේ සීතල යුද්ධයේ දී සිංහල බෞද්ධයන්ට එරෙහි වෙති. ඊනියා සාමකාරයෝ සීතල යුද්ධයක නියැලී සිටිති. ඒ සඳහා ඔවුන්ට ගෙවීමක් ද කෙරෙයි. හමුදා භටයන් යුද්ධ කරන්නේ මුදලට යැයි ලතෝනි දෙන මේ සාම මුදලාලිලා තමන් බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදයට සේවය කරන්නේ මුදලට බව නොකියති. ගැටුම් නිරාකරණය ගැන බයිලා කියන ඇතැම් විශ්ව විද්‍යාලයීය ඇංකර් මහාචාර්යවරු හා කථිකාචාර්යවරු බයිලා සඳහා

© Prof. Nalin De Silva

මුදල් ලබා ගන්නා අතර විශ්වවිද්‍යාලවල ඇතිවන ගැටුම් නිරාකරණය කිරීම සඳහා කිසිවක් නොකරති. බටහිරයන් ද ඇතුළු ඊනියා සාම දූතයෝ සිංහල බෞද්ධයන්ට එරෙහිව සීතල යුද්ධයක නිරත වන අතර සිංහල බෞද්ධයන් යුදවාදීන් යැයි ලෝ පුරා ප්‍රචාරයක් ද ගෙන යති. මේ සීතලයන්ට අනුව සිංහල බෞද්ධයන් නවගුණ වැල අතට ගෙන ප්‍රභාකරන්ට උතුරු හා නැගෙනහිර පළාත් දී දත නියවාගෙන සිටිය යුතුය.

මිලේනියම් සිටි සංකීර්ණයේ පවත්වාගෙන ගිය යුද්ධ අංශයේ නිවස වටලා බුද්ධි අංශය පාවා දී ප්‍රභාකරන් වෙනුවෙන් සේවය කළ සියල්ලන්ට හැකි ඉක්මනින් උපරිම දඬුවම් කිරීමට ජනාධිපතිනිය ආරක්ෂක ඇමැතිනිය වශයෙන් ද රාජ්‍ය නායිකාව වශයෙන් ද හමුදාවල ප්‍රධාන අණ දෙන නිලධාරිනිය වශයෙන් ද වහාම ක්‍රියාත්මක විය යුතුය. එහෙත් ඇය වටා සිටින ලිබරල් හා මාක්ස්වාදී උපදේශක කේවට්ටයන් එයට ඉඩ දේ ද යන්න සැක සහිතය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ බත් බැළයන් වූ මොවුන් දැනටමත් ඒ නොකරන බවට නීති පොත් පෙරළා කරුණු රැස්කර ගෙන ඇතැයි සිතිය හැකිය. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය බණ්ඩාරනායක කෙනකුට වඩා කුමාරතුංග කෙනෙකු වීම ද ප්‍රශ්න අවුල් කරයි. ඇය ශ්‍රී. ල. නි. පක්ෂයේ නායිකාව වුවද තවමත් හදවතින් සිටින්නේ විජය කුමාරතුංග නම් සිංහල බෞද්ධ විරෝධී සාම වෙළෙන්දා විසින් ගොඩනගන ලද මහජන පක්ෂයෙහිය.

මිලේනියම් සිටි සංකීර්ණය පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තාව තවත් වාර්තාවක් පමණක් වීමට ඉඩකඩ බොහෝය. මෙරට වාර්තා සම්බන්ධයෙන් ඇත්තේ වාර්තාය. ඒ කරුණු මෙනෙහි කර අඩුම තරමින් මේ වාර්තාව අනුව හෝ ද්‍රෝහීන් සියලු දෙනාට නිසි දඬුවම් පැමිණවීමට ක්‍රියා කිරීම අපවත්වී වදාළ සෝම හිමියන් නමින් කළ හැකි උසස්ම පිංකම වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva